# අල්ලස හා දූෂණයෙන් තොර සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවකට



අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාවේ
ප්‍රකාශනයකි .
CIABOC

# අල්ලස හා දූෂණය රට ගිල ගනිමින් පවතී




එයට විරුද්ධ වීමේ පූර්ණ අයිතිය

ඔබ සතුය.


පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම ද,
පොදු දේපල අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ
නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම ද,
ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම
යුතුකම වන්නේය.

\- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව -



ආචාරශීලී රාජ්‍ය සේවාවකට කැපවන වගයි .........

## අල්ලස හා දූෂණයට
## එරෙහි වෙමු.
## ඉසුරුබර හෙට දවසක්
## උදාකරගමු.





1-CM 23283

# අල්ලස දුරලමු !

ඔබගෙන් යමෙකු අල්ලසක් ඉල්ලුවොත්,

## දෙන්න එපා

## වහාම

අල්ලස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙන්න.



1954

අල්ලස්

* ඉල්ලීම
* ගැනීම මෙන්ම
* ලබාදීමද

අවුරුදු 07ක බරපතල සිරදඬුවම් ලැබිය හැකි වරදකි.
මෙයට අමතරව "දඩයක් සහ දණ්ඩන මුදලක් ද" නියම කළ හැකිය.






2-CM 23283

# අල්ලස දුරලමු !

වෙන කළ හැක්කක් නොමැතිකම නිසා
ඔබට මේ වන විට අල්ලසක්
දීමට සිදුවී ඇත්නම්, නොපමාව
අල්ලස් කොමිෂන් සභාව වෙත
දැනුම් දෙන්න.



පැමිණිලිකරුවා ඔබ වන්නේ නම්
නීතිය ඔබ වැරැද්දක් කළා යයි
සලකන්නේ නැත.



# දූෂණය වළකමු.


## රජයේ සේවකයෙක්

* තමාට වාසියක් කර ගැනීමට
* වෙනත් අයෙකුට වාසියක් කිරීමට
* ආණ්ඩුවට පාඩුවක් කිරීමට
* වෙනත් අයෙකුට පාඩුවක් කිරීමට

**තම නිලය (තත්වය/බලය) යොදා ගැනීම**

# දූෂණයයි.

රජයේ සේවකයෙකුගේ
එවැනි ක්‍රියා ගැන
විස්තර දන්නේ නම්
**අල්ලස් කොමිෂන් සභාවට දන්වන්න.**



# ආදායමෙන් හා ලැබීම් වලින් කළ නොහැකි වියදම් කිරීම.

යම් තැනැත්තෙකු තමාගේ
ආදායමෙන් සහ ලැබීම් වලින්
කළ හැකි ප්‍රමාණයට වඩා දේපළ රැස්
කරන්නේ නම් හෝ,
වියදම් කරන්නේ නම්

ඔහු එම මුදල් සොයන්නේ
**අල්ලස්** මගින් විය හැකියි.

එවැනි තැනැත්තෙකු ගැන දන්නේ නම්
ඔහුට හෝ ඔහුගේ පවුලේ අයට අයත් මෑතකදී
මිළදීගත් ඉඩකඩම්, යාන වාහන, මිල මුදල්, නව
නිවාස, ව්‍යාපාරික ගණුදෙනු පිළිබඳව හෝ
ඔහු හෝ ඔහුගේ පවුලේ අය කරන
වියදම් පිළිබඳව හෝ

**අල්ලස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙන්න.**



# තොරතුරු දන්වන්නේ කෙසේ ද?

* අල්ලස් කොමිෂන් සභා කාර්යාලයට පැමිණීමෙන්
* ලිපියක් එවීමෙන්
* දුරකථනයෙන්
* ෆැක්ස් මගින්
* විද්‍යුත් තැපැල මගින්

## ලිපිනය

සභාපති
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
අංක 36, මලලසේකර මාවත, කොළඹ 07.

## ක්ෂණික දුරකථන අංකය

**1954** (පැය 24 ම විවෘතයි)



## අනෙකුත් දුරකථන අංක

0112 586 257 (පැය 24 ම විවෘතයි)
0112 584 872
0112 586 851
0112 596 360

## ෆැක්ස්

011 - 259 5045

**විද්‍යුත් තැපෑල**
**ciaboc@eureka.lk**
**sccy@sltnet.lk**





3 - CM 23283


# තොරතුරු ලබාදීමේ දී.....

* ඔබේ නමින් ඉදිරිපත් විය හැක
* නිර්නාමිකව ඉදිරිපත් වන තොරතුරු ද අවධානයට යොමු කෙරේ.

නිර්නාමිකව තොරතුරු ලබාදීමේ දී
සම්පූර්ණ විස්තර සහිතව තොරතුරු ලබාදෙන්න.
මන්ද ඔබගෙන් වැඩිදුර විස්තර ලබාගත
නොහැකි බැවිනි.




ඔබේ නමින් ම තොරතුරු ලබා දුන්නද
ඔබගේ **ආරක්ෂාව තහවුරු** වන නිසා
ඔබට කරදරයක් සිදුවන්නේ නැත.



# "අල්ලස්" වන්නේ මොනවාද ?

* මුදල්
* මුදලින් අගය මැනිය හැකි ඕනෑම දෙයක් (උදා : භාණ්ඩයක්)
* මුදලින් අගය කළ නොහැකි වූවත් ඕනෑම සේවයක් උපකාරයක් හෝ වාසියක්



උදා : (1) කාන්තාවකගෙන් අයුතු ප්‍රයෝජන ඉල්ලීම.
(2) විදේශ සංචාර සඳහා අනුග්‍රහය දැක්වීම.




# අල්ලස් වැරදි කරන්නේ කවුරුන්ද ?

* අල්ලස් ඉල්ලන/ගන්නා රජයේ සේවකයන්
* අල්ලස් ඉල්ලන/ගන්නා අධිකරණ නිළධාරීන්
* ආණ්ඩුවෙන් යම් කටයුත්තක් කරදීමට අල්ලස් ඉල්ලන/ගන්නා ඕනෑම අයෙකු
* රජයේ සේවකයෙකුට අල්ලස් දෙන/දීමට යෝජනා කරන ඕනෑම අයෙකු

## අල්ලස් පනත යටතේ වරදක් කරයි.

**රජයේ සේවකයා යන්නට,**

ඇමතිවරු, මන්ත්‍රීවරු, පළාත් ආණ්ඩුකාරවරයා, පළාත් අමාත්‍ය සහ මන්ත්‍රීවරු, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා කාර්යාලවල නිලධාරීන් හා සේවකයන්, 50% කට වැඩි ආණ්ඩුවේ කොටස් ප්‍රමාණයක් ඇති සමාගම්වල නිලධාරීන් හා සේවකයන්, ආණ්ඩුවේ සංස්ථා හා මණ්ඩල වල නිලධාරීන් හා සේවකයින් සහ අල්ලස් පනත යටතේ අර්ථ නිරූපනයට ඇතුළත් වන අනෙකුත් ඕනෑම අයකු ඇතුළත් වේ.



# අල්ලස හා දූෂණය

* සමාජ, ආර්ථික හා දේශපාලනික අර්බුද ඇති කරයි.

* ලක්ෂ සංඛ්‍යාත ජනතාව දුක්ඛිත තත්ත්වයට පත්කර සාගින්දරෙන් තබයි.

* නීතිය හා සමාජ සංහිඳියාව බිඳ දමයි.

* මානව හිමිකම් උල්ලංඝනය කරයි.

* සංවිධානාත්මක අපරාධ හා ත්‍රස්තවාදයට රුකුල් දෙයි.

* සමාජ අසාධාරණය ඇති කරයි.

## එබැවින්

**වඩාත් යහපත් හෙට දිනක් උදෙසා**
**අල්ලස් හා දූෂණයට එරෙහිව**
**නැඟී සිටිමු.**



## දූෂණය නිසා

* රටේ සංවර්ධනය සඳහා යොදවන මුදල් පුද්ගල සංවර්ධනයට යෙදවීම මඟින් රටේ සංවර්ධනය පමා කරයි.

* ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් වන ආහාර පාන, ඉඳුම් හිටුම් හා රැකී රක්ෂා සැපයීමට රජයට නොහැකි වෙයි.

* රජයේ ආදායම අහිමි කිරීම මඟින් බදු පැනවීමට රජයකට බල කෙරෙන නිසා භාණ්ඩ මිල ඉහළ නංවයි.

* විදේශ ආයෝජන හා විදේශ ආධාර වළක්වාලයි.

* ජාත්‍යන්තර වශයෙන් රටට අපකීර්තියක් ඇතිවෙයි.

* නීතියට ගරු කිරීම බිඳවැටී රට ආරාජික තත්ත්වයට පත්වෙයි.


## එබැවින්

**අපේම යහපත සහ ආරක්ෂාව**
**සඳහා අපි**
**අල්ලස් හා දූෂණයට**
**විරුද්ධ වෙමු.**




## 1954 මාර්තු 01 දින
## අල්ලස් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එවකට
## අග්‍රාමාත්‍ය ධූරය දැරූ සර් ජෝන් කොතලාවල මහතා පැවසූ වදන් මෙසේය

"මෙම පනත වලංගු වූ විට දූෂණ ක්‍රියා ගැන වැරදිකාරයින් වන සියල්ලන්ම අල්ලා ගැනීමට අපට බලය ලැබෙනු ඇත. මේ රටේ සෑම පුරවැසියෙකුම සහයෝගය නොදක්වතොත් මෙම පනත නීති සංග්‍රහයට ඇතුළත් කිරීමෙන් වැඩක් සිදු නොවේ. මෙරට යුතුකම පිළිබඳ පොදු හැඟීමෙන් යුක්තව ඉදිරියට විත් අල්ලස් දූෂණ ක්‍රියා නැවැත්වීම සඳහා අපට ආධාර දිය යුතුය."



අල්ලස හා දූෂණ මර්ධනයට ඔබගේ සක්‍රීය දායකත්වය ලබාදී යුතුකම ඉටු කරනා විශිෂ්ඨ පුරවැසියෙකු වන්න.




## දඬුවම් :

* අවුරුදු 07ක සිර දඬුවම්
* රු. 5,000/ ක් දක්වා දඩය
* දණ්ඩන මුදල

## දූෂණය වරද සඳහා :

* අවුරුදු 10ක සිර දඬුවම්
* රුපියල් ලක්ෂයක දක්වා දඩය




# අල්ලස් වරදකට චෝදනා ලැබුවකු හට හිමිවන විපාක :


* පවුල් සංස්ථාව බිඳ වැටීම
* තමන් සතු වත්කම් විනාශ වී යෑම
* සමාජයෙන් ලැබෙන ගැරහුම්




අයියෝ තාත්තේ!
TATA




# පසුදා....


අම්මේ! තාත්තා අල්ලාගෙන ගියාට පස්සේ ගමේ හැමෝම අපි දිහා බලන්නේ අමුතු විදිහට?
මීට වැඩිය හොඳයි තාත්තා අපිට වහ දුන්නානම් මම නම් හෙට ඉඳලා ඉස්කෝලේ යන්නේ නෑ...
තාත්තට මාංචු දාන වෙලාවේ තාත්තා ඇඬුවලු අම්මේ... අම්මා තමයි නිතරම තාත්තගෙන් සල්ලි ඉල්ල ඉල්ලා කරදර කළේ!
මම කිව්ව පුතේ උඹලගේ තාත්තාට ඔය වැරදි වැඩ නවත්වන්න කියලා....
අක්කේ! තාත්තාව රිමාන්ඩ් කරයිද?
අම්මේ අල්ලපු ගෙදර අංකල් කිව්ව හෙට උදේට අම්මට මන්ත්‍රීතුමා හම්බවෙන්න යන්න ලෑස්ති වෙන්න කියලා!!
ගේ හරියේ සතයක්වත් නැහැ... කොහොමද මම මේ ළමයින්ට කන්න දෙන්නේ. ලෝයර් කේස් එක කතා කරන්න ලක්ෂ 5ක් ඉල්ලුවලු!!
අම්මේ මගේ Boy Friend ගෙ තාත්තා කිව්වලු මේ වගේ පවුලකට පුතාට සම්බන්ධ වෙන්න දෙන්නෙ නැහැ කියලා.... අද එයා මට කතා කළෙත් නැහැ?




ණයට නැත.



## අල්ලස හා දූෂණය සම්බන්ධ නීතිමය විධි විධාන හැකිතාක් සරලව මෙලෙස දැක්විය හැක.

(1) ප්‍ර. **අල්ලස යනු කුමක් ද?**

උ. රජයේ සේවකයකු විසින් හෝ රජයේ සේවකයකු වෙනුවෙන් නීත්‍යානුකූල නොවන තුටු පඬුරක් ඉල්ලීම හෝ ලබා ගැනීම සහ රජයේ සේවකයකු වෙත හෝ ඔහු වෙනුවෙන් නීත්‍යානුකූල නොවන තුටු පඬුරක් පිරිනැමීම හෝ පිරිනැමීමට තැත් කිරීම අල්ලසකි.

(2) ප්‍ර. **අල්ලස වරදක් වන්නේ කෙසේ ද?**

උ. *තුටු පඬුර අයැදීම, ලබාගැනීම, පිරිනැමීම හෝ පිරිනැමීමට තැත් කිරීම, රජයේ සේවකයකුගේ නිල කාර්යයක් ඉටු කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් හෝ වශයෙන් වන්නේ නම්,

*රජයේ සේවකයකුව සිටියදී තම නිල කාර්යයකට අදාළ වුවත් නැතත් තුටු පඬුරක් අයදින්නේ නම් හෝ ලබාගන්නේ නම්,

*ආණ්ඩුවේ කාර්යාලයක් සමඟ ගනුදෙනු කරන තැනැත්තෙකු එලෙස ගනුදෙනු කිරීමට පෙර හෝ පසු අවුරුද්දක කාලයක් තුළ එම කාර්යාලයේ සේවකයෙකුට තුටු පඬුරක් දෙන්නේ නම් හෝ එවැනි සේවකයෙකු විසින් එවැනි තැනැත්තෙකුගෙන් තුටු පඬුරක් ලබා ගන්නේ නම්,

**එය අල්ලස් පනත යටතේ වරදකි.**

(3) ප්‍ර. **නිල කාර්ය ඉටු කිරීම යන්නට ඇතුළත් වන්නේ මොනවාද?**

උ. නිල කාර්යය ඉටු කිරීම යන්නට එය ඉක්මන් කිරීම, ප්‍රමාද කිරීම, ඉටු කිරීමට බාධා කිරීම, ඉටු කිරීම වැළැක්වීම, ඉටු කිරීමේදී ආධාර කිරීම, පක්ෂග්‍රාහීවීම මෙන්ම නිල කාර්යයක් ඉටු කිරීමෙන් වැලකී සිටීම ද ඇතුළත් වේ.



(4) ප්‍ර. **නීතිය හෝ රක්ෂාවේ කොන්දේසි අනුව රජයේ සේවකයකුට මුදල් ලබාගැනිමට හැකි අවස්ථා තිබේද? උදාහරණයක් දෙන්න.**

උ. රජයේ වෛද්‍ය නිලධාරියෙකු හා එවැනි යම් යම් කොන්දේසි වලට යටත්ව පෞද්ගලිකව තම වෘත්තියේ යෙදීමට අවසර දී ඇති වෙනත් නිලධාරීන්.

(5) ප්‍ර, **අල්ලසක් හා තෑග්ගක් අතර වෙනසක් තිබෙද? එසේ නම් ඒ කුමක්ද?**

උ. (අ) අල්ලස හා තෑග්ග අතර පැහැදිලි වෙනසක් ඇත.

(ආ) තෑග්ගක් පිරිනැමීමේදී හෝ භාරගැනීමේදී එතැන කිසිම අයුරක වරදකාරී අදහසක් නැත. අල්ලසකදී සැමවිටම වරදකාරී අදහසක් ඇත. මෙම වරදකාරී අදහස පැහැදිලිව පෙනෙන්නට තිබෙන අවස්ථා මෙන්ම සැඟවුණු අවස්ථා ද ඇත.

(6) ප්‍ර. **වරදකාරී අදහස සැඟවුණු අවස්ථා මොනවාද?**

උ. උදාහරණයක් ලෙස රජයේ සේවකයකුට කිසියම් බැංකුවක කළමනාකාරවරයෙක් විසින් එම බැංකුවේ ගනුදෙනුකරුවන්ට සාමාන්‍යයෙන් බලපාන කොන්දේසි වලට වඩා ලිහිල් කොන්දේසි යටතේ ණයක් ලබාදීම.

(7) ප්‍ර. **රජයේ සේවකයන්ට තෑගි ලබාගැනීමට නීතිමය බාධා ඇතිද?**

උ. ආයතන සංග්‍රහයට අනුව රජයේ සේවකයකුට නෑදෑ හිතමිතුරන්ගෙන් හුදෙක්ම පෞද්ගලික කාර්යයන් වලට අදාලව තමන්ට ලැබෙන සාමාන්‍ය තෑගි බෝග හැර වෙනත් කිසිම තෑග්ගක් භාරගත නොහැක.

(8) ප්‍ර. **දූෂණය යනු කුමක්ද?**

උ. නීතියෙන් තමන්ට නියම කරන ලද නියමයන්ට විරුද්ධව කටයුතු කිරීම මඟින්,

* ආණ්ඩුවට පාඩුවක්
* තමන්ට ලාභයක්
* වෙනත් තැනැත්තෙකුට පාඩුවක්
* වෙනත් තැනැත්තෙකුට ලාභයක් වාසියක් සිදු කිරීමයි



(9) ප්‍ර. **දූෂණය වරද සංස්ථාපනය වීම සඳහා එම වරදකරන්නා අයුතු ලාභයක් ලබාගැනීම අත්‍යවශ්‍ය වන්නේද?**

උ. නැත. රජයේ සේවකයකුගේ යම් ක්‍රියාවක් නිසා ආණ්ඩුවට හෝ වෙනත් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩුවක් සිදුවන්නේ නම් දූෂණය වරද සිදුවේ. එමෙන්ම රජයේ සේවකයා හෝ වෙනත් තැනැත්තකු අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස වාසියක් ලබා ගන්නේ නම් එවිටද දූෂණය වරද සිදුවේ.

(10) ප්‍ර. **අල්ලස් පනත යටතේ වැරදි කරන්නේ කවුරුන් ද?**

උ. *රජයේ සේවකයකු විසින් තමාගේ හෝ වෙනත් රජයේ සේවකයකුගේ නිල කාර්යයන් සම්බන්ධව අල්ලසක් ඉල්ලීමේදී හෝ භාරගැනීමේදී එම රජයේ සේවකයා විසින්,

* රජයේ සේවකයකුගේ නිල කාර්යයක් ඉටු කරවාදීම සඳහා මැදිහත්වන අතරමැදියකු විසින් අල්ලසක් ඉල්ලීමේදී හෝ භාරගැනීමේදී එම අතරමැදියා විසින්,
* රජයේ සේවකයකුගේ නිල කාර්යයන් ඉටු කරවා ගැනීම සඳහා එම රජයේ සේවකයාට හෝ වෙනත් රජයේ සේවකයකුට ඔහු වෙනුවෙන් අල්ලසක් පිරිනැමීමේදී එලෙස පිරිනමන තැනැත්තා විසින්,
* ඉහත වැරදි කිරීමට තැත් කරන, අනුබල දෙන සහ කුමන්ත්‍රණය කරන තැනැත්තකු විසින්.

(11) ප්‍ර. **අල්ලස් පනත යටතේ දක්වා ඇති වරදවල් මොනවාද?**

උ. අල්ලස් පනත යටතේ වැරදි පහත පරිදි වේ.


* අධිකරණ නිලධරයන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් වූ අල්ලස්.



* යම් තැනැත්තෙකු වෙනුවෙන් රජයේ සේවකයන් හා සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ලබා ගන්නා වූ අල්ලස්.
* පොලිස් නිලධරයන්, සාම නිලධරයන් හා වෙනත් රජයේ සේවකයින් (නිල කාර්යයට අදාළව) සම්බන්ධ වූ අල්ලස්.
* රජය සමඟ වන ගිවිසුම් සම්බන්ධයෙන් සහාය වීම හෝ බලපෑම් කිරීම සඳහා වූ අල්ලස්.
* ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් වූ අල්ලස්
* ආණ්ඩුවේ ඉල්ලීම්, ගෙවීම්, පත් කිරීම්, සේවයේ යෙදවීම, ප්‍රදාන, බදුදීම් හා වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ අල්ලස්.
* ආණ්ඩුව සමඟ ගනුදෙනු ඇති තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට දෙන අල්ලස්.
* පළාත් පාලන ආයතන හෝ උපලේඛනගත ආයතනයක හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ සඳහා වූ අල්ලස්.
* පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයෙකුගේ ඡන්දය කෙරෙහි බලපෑම පිණිස තර්ජනය, වංචා කිරීම හෝ වෙනත් නීති විරෝධී ක්‍රමයකින් බලපෑමට තැත් කිරීම.
* අල්ලස් වලින් අත්කර ගන්නා ලැදැයි සැලකෙන දේපළ අයත්ව සිටීම.
* දූෂණය

(12) ප්‍ර. **අතරමැදියකු මඟින් අල්ලස් ගෙන නීතියෙන් ගැලවිය හැකිද?**

උ. නොහැක.
යම් තැනැත්තෙකුගේ දැනුම හෝ එකඟත්වය ඇතිව එකී තැනැත්තා හෝ වෙනයම් තැනැත්තෙකු වෙනුවෙන් කෙළින්ම හෝ අන් අයුරකින් ඕනෑම කෙනෙක් අල්ලස් වරදක් කළහොත් එකී වරද මුල් තැනැත්තා කරන ලද වරදක් ලෙස නීතිය සලකයි.



(13) ප්‍ර. **අල්ලස් හෝ දූෂණ්‍ය පිළිබඳ පැහැදිලි සාක්ෂි නොමැති වූ අවස්ථාවකදී එකී වරද කළවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති ද?**

උ. හැකියාව ඇත.

(14) ප්‍ර. **ඒ කෙසේද?**

උ. වත්කම් නීතිය යටතේ ය.

(15) ප්‍ර. **වත්කම් නීතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද?**

උ. තමුන්ගේ (කලත්‍රයා සහ අවුරුදු 18ට අඩු අවිවාහක දරුවන්ද ඇතුළුව) නීත්‍යානුකූල ආදායමින් කළහැකි වියදම් වලට වඩා වැඩි වියදමක් හෝ දේපළ රැස්කිරීමක් කර තිබෙන විට එම වියදම්/දේපළ රැස්කිරීම අල්ලස් මගින්, අත්කරගත් බවට (එය එසේ නොවන බවට එම තැනැත්තා විසින් ඔප්පු කරනු ලබන තෙක්) නීතිය සලකනු ලබයි.

(16) ප්‍ර. **දේපල අත්කර ගැනීම කලත්‍රයාගේ නමින් හෝ දරුවකුගේ නමින් හෝ කිරීම මගින් ගැලවිය හැකිද?**

උ. නොහැක. යමෙකුගේ කලත්‍රයා හෝ වයස අවුරුදු 18ට අඩු අවිවාහක දරුවකුගේ නමට ඇති මුදල් හෝ මුදල් නොවන දේපල (පටහැනිව කරුණු ඔප්පු කරනතෙක්) එම තැනැත්තා විසින් අත්පත් කර ගත් ලෙස නීතිය සලකනු ලබයි.

(17) ප්‍ර. **වත්කම් නීතිය බලපානු ලබන්නේ රජයේ සේවකයින්ට පමණක්ද?**

උ. නැත. අල්ලස් පනතේ 23 (අ) වගන්තිය යටතේ තමුන්ගේ නීත්‍යානුකූල ආදායමෙන් කළහැකි වියදම් වලට වඩා වැඩි වියදම් හෝ දේපල රැස් කර තිබෙන විට එම



වියදම්/දේපල රැස් කිරීම සම්බන්ධව මෙම නීතිය බලපානු ලබයි. එම තැනැත්තා රජයේ සේවකයෙක් ද නැත් ද යන්න හෝ එම තැනැත්තාට රජය සමග යම් ගනුදෙනුවක් තිබුණා ද නැත් ද යන්න වැදගත් නොවේ.

(18) ප්‍ර. **අල්ලස් ගැනීම මෙන්ම අල්ලස් දීමද වරදක් නම් නොදැනුවත්කමින් හෝ නොදී සිටීමට නොහැකිවීම හේතුවෙන් අල්ලසක් දීමෙන් පසු පැමිණිලි කිරීමෙන් පැමිණිලි කරන්නාට දඬුවම් ලැබේ ද?**

උ. අල්ලස් පනතට අනුව අල්ලස් දීමද, අල්ලස් ගැනීම මෙන්ම එක හා සමානව දඬුවම් ලැබිය යුතු වරදකි.

නමුත් අල්ලස් දුන් තැනැත්තා පැමිණිලිකරු වන අවස්ථාවකදී නීතිය එම තැනැත්තා වරදකරුවකු ලෙස නොව අල්ලස් ඉල්ලන්නාගේ ගොදුරට ලක් වූ පුද්ගලයකු ලෙස සලකනු ලබයි.

කෙසේ වුවද යමෙකු අල්ලසක් ඉල්ලා සිටින්නේ නම් අල්ලස දීමට පෙර ඒ පිළිබඳ පැමිණිලි කිරීම වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයයි.

^19& ප්‍ර. **අල්ලසක් සඳහා හුවමාරු විය යුත්තේ මුදල් හෝ මුදලින් අගය මැනිය හැකි වෙනත් දේපලක් පමණක් ද?**


උ. නැත. අල්ලසක් සඳහා මුදල්, මුදලින් අගය මැනිය හැකි දෙයක් මෙන්ම මුදලින් අගය මැනිය නොහැකි දෙයක්ද හුවමාරු විය හැක.

(20) ප්‍ර. **එය පැහැදිලි කරන්න.**

උ. අල්ලක් සඳහා හුවමාරු වියහැකි දේ ගැන අල්ලස් පනත ඉතා පුළුල්ව අර්ථකථනය කර ඇත.

පණතට අනුව

(අ) ණයක්, ගාස්තුවක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබීමක්,



(ආ) යම් ධුරයක් හෝ රක්ෂාවක් හෝ ලබාදීමක්,

(ඇ) යම් ණයක් හෝ බැඳීමක් හෝ නිදහස් කිරීමක්, නඩු පැවරීමකින් හෝ විනය ක්‍රියාමාර්ගයකින් ආරක්ෂාව ලැබීමක්.

(ඈ) යම් අයිතිවාසිකමක් හෝ නිලබලයක් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉන් වැළකීමක්,

(ඉ) කවර හෝ වර්ගයකට අයත් වෙනයම් සේවයක් උපකාරයක් හෝ වාසියක් ලබාදීමක්,
ආකාරයෙන් විය හැකිය.

**(21) ප්‍ර. කවර වර්ගයකට හෝ අයත් සේවයක් උපකාරයක් හෝ වාසියක් යන්නට ඇතුළත් වන්නේ මොනවාද?**

උ. (අ) ලිංගික අල්ලසක් ලබාගැනීම තුළින් කායිකව ලබන්නා වූ තෘප්තියක් අල්ලසක් විය හැකිය.


(ආ) දරුවකු ජනප්‍රිය පාසලකට ඇතුළත් කරවාදීම මඟින් ලබන්නා වූ උපකාරයක් අල්ලසක් විය හැකිය.

(ඇ) විදේශ ශිෂ්‍යත්වයක් ලබාගැනීම තුළින් ලබාගන්නා වූ වාසියක් අල්ලසක් විය හැකිය.

**(22) ප්‍ර. අල්ලස් පනත යටතේ වරදකට වරදකරු වීමෙන් ලැබිය හැකි දඬුවම් කවරේද?**

උ. 1. අල්ලසක් දීමක්, ලබාගැනීමක්, අයැදීමක් හෝ ඉහත කවරක් හෝ කිරීමට තැත් කිරීමේදී කුමන්ත්‍රණය කිරීමේදී හෝ අනුබල දීමේදී

(අ) අවුරුදු 7ක් නො ඉක්මවන කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීම සහ රු. 5,000/- නොඉක්මන දඩයක් නියම කිරීම.



(ආ) ඉහත දඬුවම් වලට අමතරව අල්ලස ලෙස හුවමාරු වූ තුටු පඬුරේ වටිනාකමට සමාන මුදලක් දණ්ඩනයක් වශයෙන් අය කිරීම.

2. යම් වත්කමක් අල්ලසින් ලබාගත් බවට ඔප්පු වුවහොත් ඉහත 1 (අ) දඬුවමට අමතරව එකී වත්කමෙහි වටිනාකමට අඩු නොවන සහ තුන් ගුණය නොඉක්මවන දණ්ඩනයක් නියම කිරීම හෝ ඒ වෙනුවට වත්කම රාජසන්තක කිරීම.

3. දූෂණය වරදට වරදකරු වුවහොත් අවුරුදු 10 නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමක් හෝ රුපියල් ලක්ෂය නොඉක්මවන දඩයක් හෝ ඉහත දඬුවම් දෙකම හෝ ලැබිය හැක.

(23) ප්‍ර. **ඉහත දඬුවම්වලට අමතරව වෙනත් අශක්නුතාවන් වලට යටත්වීමට සිදුවේ නම් ඒ මොනවාද?**


උ. 1. තමාගේ රැකියාව හෝ ධූරය අහිමි වීම. මේ සමඟම විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිකම් අහෝසි වේ.

2. පාර්ලිමේන්තු මැතිවරණයකට නම් අවු. 7කට සහ පළාත් පාලන මැතිවරනයකට නම් අවු. 5කට ජන්දය දීමට හෝ තේරිපත්වීමට නුසුදුසු වීම.

3. රජයේ හෝ උපලේඛනගත ආයතනයක රැකියාවක් හෝ ධූරයක් ලැබීමේ අවස්ථාව සදහටම අහිමි වීම.

(24) ප්‍ර. **ශ්‍රී ලංකාවෙන් පිටතදී රජයේ සේවකයකු විසින් අල්ලසක් අයැදීම හෝ භාර ගැනීම වරදක් වේද?**

උ. ඔව්, ඒ වරද ශ්‍රී ලංකාව තුළදී කරන ලද්දේ යැයි සලකා නඩු පැවරීමට කටයුතු කළ හැක.



(25) ප්‍ර. **අල්ලස් නීතිය යටතේ විමර්ශන අවස්ථාවේදී හා නඩු කටයුත්තක සාක්ෂිදීමට ඉදිරිපත් වන්නන්ට අල්ලස් නීතිය යටතේ රැකවරණය සලසා තිබේද?**

උ. ඔව්, අල්ලස් පිළිබඳ වරදකදී සාක්ෂි දීමට ඉදිරිපත්වන්නෙකුට එසේ සාක්ෂි නොදීමට පොළඹවන, තර්ජනය කරන, බල කරන හා සාක්ෂිකරුගේ කීර්තියට හෝ ශරීරයට හානි කිරීම සම්බන්ධයෙන්, අල්ලස් කොමිෂන් සභාව විසින් නඩු පැවරීමට කටයුතු කළ හැකිය.




# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

1994 අංක 19 දරණ පනතින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණය කිරීමට හා අල්ලස් පනත හා වත්කම් හා බැරකම් ප්‍රකාශයට පත් කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා සංස්ථාපනය කරන ලද ස්ථිර හා ස්වාධීන කොමිෂන් සභාවකි.

මෙම කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ 1958 සිට ක්‍රියාත්මක වූ අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා අල්ලස් කොමසාරිස් ධූරය අහෝසි විය.

කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරන විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් හා අපරාධ විමර්ශන හා නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තෙකුගෙන් සමන්විත වේ.

කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් විමර්ශනය කිරීමෙන් අනතුරුව වරදක් කළ බවට කරුණු අනාවරණය වන්නේ නම් කොමිෂන් සභාව විසින් නඩු පවරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධානය කරන අතර එලෙස පවරන ලද නඩු මෙහෙයවීම කොමිෂන් සභාවේ නීති නිලධාරීන් විසින් සිදුකරනු ලබයි.



## පගා ජරාව මිනිසාගේ ආහාරය නොවේ.



## මෙවන් අය සමාජයෙන් තුරන් කිරීම අප සැමගේ යුතුකමයි.

- ඔබගෙන් යම් තැනැත්තෙකු අල්ලස් ඉල්ලුවහොත් හෝ
- ඔබට මේ වන විටත් අල්ලස් දීමට සිදු වී ඇත්නම් හෝ
- යම් තැනැත්තෙකු මෑතකදී තම ආදායමට වඩා වැඩියෙන් වත්කම්, ඉඩම්, මිල මුදල්, යාන-වාහන රැස් කරගෙන ඇත්නම් හෝ
- ආදායමට වඩා වියදම් කරන බව පෙනේ නම් හෝ

අප වෙත තොරතුරු ලබා දෙන්න.
(රහස් හෙළි නොකිරීමට අපි දිවුරුම් දී සිටිමු.)


**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**අංක 36, මලලසේකර මාවත, කොළඹ 07.**
**දුරකථනය : 011-25 86 841, 25 96 362, 25 84872, 25 86 257, (පැය 24 ම විවෘතයි.)**
**ෆැක්ස් : 011-2596014 / 2595045**




රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව